## ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග් හි ශ්‍රී ලංකාවේ භූමිකාව

ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග්, එහි කාර්යාලයක් ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද්දේ 1965 දී දිවංගත රණසිංහ ප්‍රේමදාස මහතාගේ ආරාධනය පරිදිය.

වෙනත් කිසිදු රටක ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග් ආයතනය මෙතරම් දිගු කාලයක් නොකඩවා කටයුතු කර නැත. මුල් අවධියේ සිවිල් සමාජය සමඟ ඇති කරගත් සබඳතාවය මේ වන විට වෘත්තීය සංගම් සමඟ සමීප සම්බන්ධතාවක් දක්වා වර්ධනය වී තිබේ. මෙම සහයෝගීතාවය පසුව සිවිල් සමාජ ක්‍රියාකාරීත්වයන්හි බොහෝ ක්ෂේත්‍රයන් දක්වා පුළුල් කරන ලද අතර රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන රාශියක් අපගේ දේශීය ක්‍රියාකාරකම් වලට සහභාගි වන කොටස්කරුවන් බවට පත්වෙමින් සිටිති.

ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග් හි ගමන් මගේ සුවිශේෂ සන්ධිස්ථානයක් වූයේ 1974 දී ශ්‍රී ලංකා පදනම සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා පදනම් ආයතනය පිහිටුවීමයි.

ශ්‍රී ලංකා පදනම් ආයතනය පිහිටුවීමේ ව්‍යාපෘතියෙහි ඉලක්ක වූයේ:

- ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමය සහ මානව හිමිකම් ආරක්ෂා කිරීම පළිබඳව වූ අවබෝධයන් විශ්වාසයන් ප්‍රවර්ධනය කිරීම,
- ප්‍රජාතන්ත්‍රවාදී ජීව ගුණය, ජාත්‍යන්තර අවබෝධය සහ සහයෝගීතාවය සහ ජනවර්ගය, ලිංගිකත්වය, භාෂාව හෝ ආගම පිළිබඳව නොසලකමින් සෑම දෙනා වෙතම මානව හිමිකම් සහ මූලික නිදහස උදාකර දෙන්නා වූ විශ්වීය ගරුත්වය ප්‍රවර්ධනය කිරීම,
- සියලුම ආකාරයේ දැනුම් මට්ටම් වලින් යුත් ජනතාව අතර අධ්‍යාපනය, දැනුම ලබා ගැනීම හා දැනුම බෙදාහැරීම සහ සමාජ ප්‍රගතිය දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම යන කරුණු වේ.

ශ්‍රී ලංකා පදනම් ආයතනය බහුත්වවාදී දේශපාලන සාකච්ඡාවන් සඳහා පිළිගත් පරිශ්‍රමයක් ලෙසත්, පුහුණුව වැඩි දියුණු කිරීම සඳහා වූ මධ්‍යස්ථානයක් ලෙසත් සිවිල් සමාජ සහ රජයේ කොටස්කරුවන් අතර සබඳතා ගොඩනැගීමේ අවශ්‍යතාවය ඉටුකරන මධ්‍යස්ථානයක් ලෙසත් සංවර්ධනය වී තිබේ.

1984 දී ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය පිහිටුවීමෙන් ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග් ආයතනය දිවයිනේ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය පුහුණු ක්ෂේත්‍රය වෙත කැපී පෙනෙන මෙහෙවරක් ඉටුකරන ලැබ තිබේ. ශ්‍රී ලාංකික රූපවාහිනී මාධ්‍යවේදීන්ට ඉහළම මට්ටමේ වෘත්තීය දැනුම, කුසලතා හා අත්දැකීම් ලබා දීම මෙම ආයතනයේ අපේක්ෂාවයි.

ශ්‍රී ලංකා පදනම සහ ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග් ආයතනය අතර ඇතිකර ගෙන තිබූ සහයෝගිතා ගිවිසුමට අනුව පසුකාලීනව යට කී ආයතනය අපගේ කොටස්කරුවන් වූ ශ්‍රී ලංකා පදනම වෙත භාර දෙන ලදී.

වසර ගණනාවක් තිස්සේ ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග් ආයතනය සමාජ පරිවර්තන ක්ෂේත්‍රයේ දේශීය සිවිල් සමාජ සංවිධාන සහ රාජ්‍ය ආයතන සමඟ ඉතා සමීපව කටයුතු කරයි. කම්කරු සංවිධාන සමඟ කටයුතු කිරිමෙහිලා ෆෙඩ්රික් ඒබට් ස්ටිෆ්ටුංග් ආයතනයෙහි අත්දැකීම් අද්විතිය වෙයි. මෙම සහයෝගීතා

ක්‍රියාකාරකම් තුළින් ඒකාබද්ධව සහ තනිව ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශන රාශියකි. ඒ අතර ප්‍රජාතන්ත්‍රවාදය, ආර්ථිකය, ශ්‍රමික, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ගැටුම් නිරාකරණය, ජනමාධ්‍ය, දකුණු ආසියානු සහයෝගීතාවය ආදී පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කෙරෙන දැනුම් සම්භාරයකින් යුත් ප්‍රකාශන තිබේ.

ෆෙඩ්රික් ඊබර්ට් ස්ටිෆ්ටුංග් ආයතනය සමාජ-ආර්ථික විෂයයන්ට අදාළ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහ අධ්‍යාපන ව්‍යාපෘතීන්ටද සහයෝගය දක්වා තිබේ.

සමහර ප්‍රගතිශීලී අරමුණු දිනාගැනීම සඳහා අන්‍යොන්‍ය රුචිකත්වයෙන් යුත් අංශවල ක්‍රියාකරන දේශීය කොටස්කරුවන් සමඟ ඒකාබද්ධ ක්‍රියාකාරිත්වයන්හි ෆෙඩ්රික් ඊබර්ට් ස්ටිෆ්ටුංග් ආයතනය නොකඩවා සම්බන්ධ වෙයි. ඒ මඟින් කොටස්කරුවන් සමඟ එක්ව කරන කටයුතු වල ක්‍රියාකාරකම් හැඩගැන්වීමට මහඟු ඉඩකඩක් ලැබේ. ප්‍රතිඵල මඟින් ජයග්‍රහණය කරනු ලබන සාමූහික අරමුණු නිශ්චිත සහ මිණිය හැකි බව මේ මඟින් සහතික කෙරෙයි. මේ සියලු දේශීය පරිශ්‍රමයන් මඟින් ෆෙඩ්රික් ඊබර්ට් ස්ටිෆ්ටුංග් ආයතනය අපේක්ෂා කරන්නේ ධනාත්මක සහ ඵලදායී ප්‍රතිඵල උදා කළ හැකි වර්ධනීය සහ විද්‍යාත්මක සහයෝගිතා ක්‍රියාවලියක් නිර්මාණය කිරීමටය.